# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** 011 7920950, 0117920951**Fax:** 011 7920949
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org

ජනාධිපතිවරණය 2010

ප්‍රවෘත්ති නිවේදනය අංක 15

2010 ජනවාරි 18 වන දින

<u>උතුරු මැද පළාත</u>

<u>කුරුණෑගල මිනිස් ඝාතනයක්</u>

ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍ය එස්.බී.නාවින්න මහතාගේ ආධාරකරුවන් පිරිසක් විසින් පහර දෙනු ලැබීම නිසා බරපතල තුවාල ලැබූ ධම්මික හේරත් (මංජු) මිය ගොස් ඇත. වාරියපොළ එ.ජා.ප සංවිධායිකා හා පාර්ලිමේන්තු මන්ත්‍රීනී අමරා පියසීලි මහත්මියගේ පුත්‍රයා වන මංජුල බංඩාර මහතා පවසන පරිදි පෙරවරු 12.30 ත් 1.30 ත් අතර මෙම සිද්ධිය සිදුවී තිබේ. වාරියපොළ රෝහලට ඇතුළත් කිරීමේදී ධම්මික හේරත් මහතා මිය ගොස් සිට ඇති බව මංජුල බංඩාර මහතා පවසයි. පශ්චාත් මරණ පරික්ෂණය සඳහා සිරුර කුරුණෑගලට යවා ඇත. පශ්චාත් මරණ පරික්ෂණය කළ වෛද්‍ය එච්.එම්.කේ.සේනානායක මහතා පැවසුවේ පිටුපස ගෙල ප්‍රදේශයට පහර දීම නිසා සුසුම්නාවට හානි සිදුවී ඇති බවය. සිරුරේ පහර දීම් නිසා සිදුවූ තුවාල 7 ක් තිබෙන බව වෛද්‍ය සේනානායක මහතා තවදුරටත් පැවසීය.

සිද්ධිය ඇසින් දුටු සාක්කිකරුවකු වෛද්‍ය සේනානායක මහතාට පවසා ඇත්තේ පහර දෙන විට පුද්ගලයකු බිම ඇද වැටුණු බවත් ඒ අවස්ථාවේ ප්‍රහාරකයන් පලා ගිය බවත්ය. රෝහලට ඇතුළත් කිරිමට පෙරම ධම්මික හේරත් මහතා මිය ගොස් තිබිණ.

වාරියපොළ පොලිසියේ උප පොලිස් පරික්ෂක එම්.ජී.තිලකරත්න පැවසුවේ සිද්ධිය සම්බන්ධයෙන් 5 දෙනකු සැකපිට අත් අඩංගුවට ගෙන ඇති බවය. පහර කෑමට ලක් වූවන් සැකකරුවන් හඳුනාගෙන ඇති බවත් පොලිස් පරික්ෂණ දිගටම සිදු කෙරෙමින් පවතින අතර වැඩි විස්තර හෙළි කිරීමට නොහැකි බවත් උප පොලිස් පරික්ෂකවරයා පවැසීය.

හේරත් මහතා හා තවත් පිරිසක් වාරියපොළ අඹකඩවර ප්‍රදේශයේ ජනරාල් සරත් ෆොන්සේකාගේ පෝස්ටර් අලවමින් සිටි අවස්ථාවේ 15 කින් සැදුම් ලත් එ.ජ.නි.ස. ආධාරකරුවන් පිරිසක් යතුරු පැදි 7 කින් පැමිණ පහර දීම සිදුකර ඇති බව මංජුල බංඩාර මහතා පවසයි.

ඇමති නාවින්න මහතා මැ.ප්‍ර.නි.ම.යට පැවසුවේ දෙපිරිසක් අතර සිදුවී ඇති මෙම සිද්ධියෙන් කිහිප දෙනකු තුවාල ලබා එක පුද්ගලයකු ඝාතනයට ලක් වී ඇති බව තමා දන්නා නමුදු සිද්ධියට සම්බන්ධ වැඩිදුර විස්තර පිළිබඳව තමා නොදන්නා බවය.

## මධ්‍යම පළාත

## මාතලේ බරපතල තුවාල සිදු කිරීමක්

අලුයම 3.30ට පමණ දඹුල්ල ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.රූපසිංහ මහතාගේ නිවසට කඩා වැදී ඒ මහතාට බරපතල තුවාල සිදු කොට ඇත. මුහුණු වසාගත් සිවු දෙනකුගෙන් සමන්විත පිරිසක් රූපසිංහ මහතා ව කඩුවලින් කපා දමා ඇති බව අපගේ මැ.ප්‍ර.නි.ම නියෝජිතයා පවසයි. මෙම ප්‍රහාරයට ලක්වීමෙන් ඒ මහතාගේ බෙල්ල,පපුව සහ වම් අතේ ඉහළ කොටස් කැපී ගොස් ඇත.

දඹුල්ල රෝහල් පොලිසියේ සාජන්ට් තිස්ස බංඩාර පවසන පරිදි රූපසිංහ මහතාගේ වම් අත කැපීම නිසා අතේ ස්නායුවක් ද කැපී ගොස් ඇත. මේ නිසා විශේෂ ප්‍රතිකාර සඳහා ඔහු මහනුවර රෝහලට ඇතුළත් කර තිබිණ.

සීගිරිය පොලිසියේ මැතිවරණ ශාඛාව භාර ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කුලතුංග මහතා මැ.ප්‍ර.නි.මයට පැවසුවේ තුවාල ලත් රූපසිංහ මහතා ගෙන් කටඋත්තරයක් ලබා ගෙන ඇති බවය. කඩුවලට සමාන පැතලි යකඩ පටිවලින් ඔහුට පහර දුන් පව රූපසිංහ මහතාගේ භාර්යාව පවසා ඇති අතර සිද්ධිය සම්බන්ධ පැමිණිල්ලක් **(EIB 20/25)** පොලිසියේ සටහන් වී ඇත.

රූපසිංහ මහතාගේ නිවසේ පිටුපස දොර කඩා ඇතුල් වී ඇති ප්‍රහාරකයන් ඒ මහතාගේ බිරියගේ ගෙලට කඩුවක් එල්ල කොට ''කෑ ගැසුවොත් මරනවා'' යනුවෙන් තර්ජනය කර නිවස තුළට වැදි රූපසිංහ මහතාට පහරදී ඇතැයි රූපසිංහ මහත්මිය පැවසුවාය. මුහුණ, උරහිස, බෙල්ල සහ කකුලේ කැපුම් තුවාල සහිතව ඔහු රෝහලට ඇතුළත් කළ බව පැවසූ රූපසිංහ මහත්මිය පස්වරු 4.30ට පමණ තම සැමියා ශල්‍ය කර්මයකට භාජනය කිරීමට නියමිතව සිටි බව සඳහන් කළාය.

අපගේ මැ.ප්‍ර.නි.ම නියෝජිතයා අනාවරණය කර ගෙන ඇති පරිදි පක්ෂය තුළ ඇතිවූ ප්‍රශ්නයක් මෙම සිද්ධියට හේතු වී ඇත. මේ සම්බන්ධයෙන් රූපසිංහ මහත්මිය පැවසුවේ එය එසේ විය හැකි යැයි තමා අනුමාන කරන නමුදු නිශ්චිතව ඒ ගැන යමක් කීමට නොහැකි බවය.

කෙසේ වෙතත් රූපසිංහ මහතා මාතලේ දිස්ත්‍රික් සංවිධායකවරයකු වන නීතිඥ ලක්ෂ්මන් පෙරේරා මහතාට වැඩ කළ බව ඇය සඳහන් කළාය.

## මාතලේ වෙඩි තැබීමක්

ජනවාරි 16 වැනිදා පස්වරු 10.30 ත් 11.00 ත් අතර මාතලේ නගර සභික රෝෂාන් ද සිල්වා මහතාගේ නිවසට වාහනයකින් පැමිණි නාඳුනන පිරිසක් ඒ මහතාට වෙඩි තබා ඇතැයි මැ.ප්‍ර.නි.ම නියෝජිතයා පවසයි. හදිසි දුරකතන අංකයට කළ දැනුම් දීමකින් පස්වරු 11.00 ට පමණ සිද්ධිය සිදුවූ ස්ථානයට පොලිසිය පැමිණ ඇත.

පැමිණි වාහනය ගැන තොරතුරු ලබා ගැනීමට මාතලේ නගරය අවට සෝදිසි කර ඇති නමුදු ලැබී ඇති තොරතුරු ප්‍රමාණවත් නොමැති බැවින් කිසිවකු අත්අඩංගුවට ගැනීමට නොහැකි වී ඇති බව මාතලේ පොලිසියේ ස්ථානාධිපති පොලිස්පති ජයම්පති මහතා මැ.ප්‍ර.නි.මයට පැවසීය.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට ජනවාරි 17 වැනි දා දක්වා ලැබී ඇති තොරතුරු අනුව සමස්ත මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සහ නීති උල්ලංඝණය කිරීම් සංඛ්‍යාව 620 වී ඇත. ඉන් 276ක් ප්‍රධාන සිදුවීම් වන අතර 344 ක් සුළු සිද්ධීන් ලෙස සැලකේ. මින් 4 ක් මනුෂ්‍ය ඝාතන වන අතර මිනී මැරීමට තැත් කිරීම් 5 කී. පහරදීම් 74 ක් ද, තර්ජනය කිරීම් හා බියවැද්දීම් 78 ක් ද බරපතල තුවාල සිදු කිරීම් 27 ක්ද තුවාල කිරීම් 31 ක් ද, රාජ්‍ය දේපල අයුතු ලෙස පරිහරණය කිරීම් 35 ක් ද, සොරකම් 11 ක් ද, ගිනි තැබීම් 11ක්ද, වාර්තාවී ඇත. ගිනි අවි භාවිතා කිරීම් 89 ක් ද වන බව මැ.ප්‍ර.නි.ම සඳහන් කරයි.

**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය [CMEV] 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාත සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.**



ආචාර්ය පී. සරවනමුත්තු

සම කැඳවුම්කරු



සුනිල් ජයසේකර

සම කැඳවුම්කරු



උදය කළුපතිරණ

සම කැඳවුම්කරු